# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2213/47 - 2021 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා - 2021.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකයඃ පීඑස්/සීඑස්ජී/00/1/14/28.

මුද්‍රාව

ගෝඨාභය රාජපක්‍ෂ

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ මැතිතුමන් විසිනි**

1. ගරු ධම්මික ප්‍රියන්ත සමරකෝන් ජයවර්ධන මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. ගරු ඛේමා කුමුදිනී වික්‍රමසිංහ මැතිතුමිය
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
3. ගරු රත්නප්‍රිය ගුරුසිංහ මැතිතුමා
   අභියාචනාධිකරණ විනිශ්චයකාර

වෙත,

සුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වැනි අධිකාරය) 2 වැනි වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්‍ෂ වන මවිසින්, 2020 ජනවාරි මස 09 වැනි දිනැති අධිකාර පත්‍රය මගින් දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබූ බව සැලකිල්ලට ගනිමින්,

1A - G 33657 — 395 (2021/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2021 ජනවාරි මස 28 වන දින පිහිටුවන ලද, 2021 ජනවාරි මස 29 වන දින අංක : 2212/53 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකෙරුණු නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට අදාළ විධානයෙහි පළමු වන ඡේදය, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත පරිදි සංශෝධනය කරමි.

"රජය වෙනස් වීමත් සමග රජයේ නිලයෙන් ඉල්ලා අස් වූ හෝ අන්‍යාකාරයෙන් රජයේ නිලය දැරීම අවසන් වූ එසේ නැතහොත් එබඳු රජය වෙනස් වීමෙන් අනතුරුව ද එම නිලය තව දුරටත් දැරුවා වූත් පිළිවෙලින් 2015 ජනවාරි මාසයේ දී සහ අගෝස්තු මාසයේ දී පැවති ජනාධිපතිවරණයට සහ/හෝ මහ මැතිවරණයට පෙර නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයෙහි සාමාජිකයින් හෝ කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට 2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ දී සෘජුව හෝ ව්‍යාංගයෙන් සිදුවී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගෙන විමර්ශනය කිරීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පත් කල ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව වෙළුම් 03 කින් සහ ලිපි දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීම යන පරිශිෂ්ඨයෙන් ද සමන්විතව මා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව එකී අවසන් වාර්තාවේ අයිතම අංක 08, 09 සහ 10 යටතේ දැක්වෙන තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව අවධානයට ලක් කරමින් ද",

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිඑකක් වූ පෙබරවාරි මස 05 වන දින වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

02 - 429

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.